**ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය - 2021**

---

**1. මූල්‍ය ප්‍රකාශන**

---

**1.1. තත්ත්වාගණනය කළ මතය**

---

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ("ශ්‍රී ලංකා ක්‍රිකට්") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, සමුච්චිත අරමුදල් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2. තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සම්මේලනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංස්ථාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4. විගණන විෂය පථය

----------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

-----------------------------------------------------------------------

### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

------------------------

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 හා 2015 වර්ෂවල ආරම්භ කරන ලද ව්‍යාපෘති හතරක වටිනාකම රු. 47,438,675ක් වන අතර මධ්‍යම ඉංජිනේරු උපදේශන කාර්යාංශය වෙත පවරා තිබූ ඉදිකිරීම් කටයුතු සඳහා පළාත් පාලන ආයතනවලින් හා නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමැතිය ලබා නොගැනීම හේතුවෙන් එම ව්‍යාපෘති අත්හැර දමා තිබුණි. නමුත්, අත්හැර දැමූ එම ව්‍යාපෘතිවල වටිනාකම මේ වනවිටත් මූල්‍ය ප්‍රකාශනවල ගැලපීම් නොකර කෙරීගෙන යන වැඩ වශයෙන් දක්වා තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සමාලෝචිත වර්ෂය අවසාන වනවිට කෙරීගෙන යන වැඩවල වටිනාකම රු. 47,438,675කින් වැඩියෙන් දක්වා තිබුණි. | සමාලෝචිත වර්ෂය අවසන් වන විට අවසන් කර නොමැති ව්‍යාපෘති හතරක් මෙමගින් දක්වා ඇත. එනිසා, පත් කරන ලද විශේෂඥ තාක්ෂණික කමිටුවේ අවසන් නිර්දේශය මත පදනම්ව ඉදිරි වැඩසටහන් ක්‍රියාත්මක කරන තෙක් මුළු ශේෂය කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ තුළ නිරූපණය වේ. ව්‍යාපෘතිවල තථ්‍ය වටිනාකම ආපසු අයකර ගැනීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | මූල්‍ය ප්‍රකාශන තුළ අනුකූල නොවීම් නිවැරදි කිරීමට හා අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ක්‍රිකට් ක්‍රීඩාවේ උන්නතියට දායක වීම සඳහා ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් සෑම වසරකම දිවයින පුරා ක්‍රිකට් ක්‍රීඩාංගණ සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය වියදම් සෘජුවම දරනු ලබන අතර, ප්‍රාදේශීය සංගම් වෙත අවශ්‍ය | වාර්තා කිරීමේ අනිවාර්ය අවශ්‍යතාවයක් නොවන බැවින් ක්‍රීඩා සංගමයට ලබාදුන් ප්‍රදානයන් මූල්‍ය ප්‍රකාශනවල වෙනම ශේෂයක් වශයෙන් හෙළිදරව් නොකළෙමු. කෙසේ වෙතත්, යෝජනාව අනුව මේ | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් හා ගැලපීම් සිදුකිරීමට කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| ප්‍රදානයන් සිදුකර තිබුණි. කෙසේ වෙතත්, එම ක්‍රිකට් ක්‍රීඩාංගණ සංවර්ධන වියදම් ගිණුම්ගත කිරීම සඳහා වන ගිණුම්කරණ ප්‍රතිපත්ති ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් හඳුන්වා දී නොතිබුණි. එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය සෘජුවම මෙහෙයවන ලද ව්‍යාපෘති නවයක් සඳහා ලබාදී ඇති අත්තිකාරම් මුදල රු. 93,553,954 ක් හා ඉදිකිරීම් ව්‍යාපෘති හයක් සඳහා ක්‍රිකට් සංගම් වෙත ලබාදී ඇති ප්‍රදානයන් රු. 89,828,319 ක් වූ අතර එම අත්තිකාරම් කෙරීගෙන යන ප්‍රාග්ධන වැඩ සහ ප්‍රදානයන් වශයෙන් වෙන් වෙන්ව හඳුනාගැනීම වෙනුවට අත්තිකාරම් වශයෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | පිළිබඳව අපගේ උපදේශකයන් හා මූල්‍ය උපදේශන කමිටුව වෙත යොමුකර ඒ අනුව කටයුතු කරන්නෙමු. |

## 1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 ලැබිය යුතු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ලැබිය යුතු රඳවාගැනීම් බදු ආදායම් හා එකතු කළ අගය මත ලැබිය යුතු බදු ආදායම් එකතුව පිළිවෙලින් රු.38,229,740ක් හා රු. 261,376,152ක් වර්ෂ 2 සිට 5ක කාලයක් දක්වා අය කරගෙන හෝ මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. | ලැබිය යුතු රඳවා ගැනීමේ බදු ශේෂය අයකර ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී. | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකිරීමට හා ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කඩිනමින් කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගමකින් ලැබිය යුතු රු. 2,222,800 ක් වූ දායකත්ව මුදල් වර්ෂ 3කට වඩා වැඩි කාලයක සිට අයකරගෙන හෝ මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණි. | 2021 වර්ෂයේදී රු. 61,600ක් පියවා ඇති අතර ඉමිතියාස් ආයතනය වෙත ගෙවිය යුතු ශේෂයන් ණය ගැතියාගෙන් අය කර ගැනීමට කටයුතු කරමින් පවතී. සෘජු තහවුරු කිරීම් ලිපි ලියාපදිංචි තැපැල හරහා බෙදා හැර ඇති අතර තහවුරු කිරීමේ ලිපි අදාළ අනුග්‍රාහකයන් වෙත යොමුකර ඇත. වඩාත් නිවැරදි තහවුරු කිරීමක් සඳහා පහත වගන්තිය යොදා ඇත. අදාළ වගන්තිය නම්, “ලිපියේ දින සිට සති තුනක් ඇතුළත මෙම ලිපියට ප්‍රතිචාරයක් නොලැබුණහොත්, මෙහි දක්වා ඇති ශේෂය පිළිබඳව ඔබ විසින් | මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදුකළ යුතු අතර ලැබිය යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | නිවැරදි බවට එකඟ වූ බව සලකනු ලැබේ”. | |
| (ඇ) | 2018 ශ්‍රී ලංකා දකුණු අප්‍රිකානු සංචාරය සඳහා ලැබිය යුතු අනුග්‍රාහකත්ව හිමිකම් ආදායම වූ රු. 37,557,263 (ඇ.එ.ජ. ඩොලර් 187,085) ක් අදාළ අනුග්‍රාහක සමාගමෙන් ලැබිය යුතු බවට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. කෙසේ වෙතත්, ඉහත ගනුදෙනුව සඳහා බලපෑම් ඇතිකරන සැකමුසු හා අක්‍රමවත් මැදිහත්වීම් හේතුවෙන් අනුග්‍රාහකයන්ගෙන් එම මුදල අයකරගැනීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි. | 2018 ශ්‍රී ලංකා දකුණු අප්‍රිකානු සංචාරය සඳහා ජාත්‍යාන්තර රූපවාහිනී, ගුවන්විදුලි, ජංගම දුරකතන, අන්තර්ජාල සහ අනුග්‍රාහකත්වයන්ගේ අවසාන ගෙවීම (15%) ලෙස Sony Pictures Network India (Pvt) Ltd මගින් 2018 අගෝස්තු 01 දිනට ලැබිය යුතු ඇ.එ.ජ. ඩොලර් 187,084.75 ක් මෙයට ඇතුළත් වේ. වාර්තාකරණ දිනය වනවිට මෙය ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ලැබී නොතිබුණි. කෙසේ වෙතත්, සැපයුම්කරු විසින් එම මුදල ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය වෙත ගෙවා ඇති බව ප්‍රකාශ කර ඇත. මේ පිළිබඳ පරීක්ෂණයක් කොළඹ මහේස්ත්‍රාත් අධිකරණයේ (නඩු අංක බී/657/01/18 නඩුව) විභාග වෙමින් පවතින අතර, මූල්‍ය ප්‍රකාශන නිකුත් කරන දිනය වන විටත් එය අවසන් කර නොමැත. කළමනාකාරිත්වයේ අදහස වන්නේ ලැබී ඇති නෛතික උපදෙස් මත පදනම්ව මෙම මුදල අයකර ගත හැකි වුවද, ගිණුම්කරණ ප්‍රමිතීන් අනුව අවදානම අවම කිරීම සඳහා විධිවිධාන හඳුනාගෙන ඇත. | ලැබිය යුතු මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6.2 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2007 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා වන කාලපරිච්ඡේදයට අදාළව එකතුව රු. 12,794,805 ක මුදලක් අයකර නොගෙන හෝ මූල්‍ය ප්‍රකාශනවල එම ශේෂයන් ගැලපීමකින් තොරව පැවතුණි. | එම ශේෂයන් අයකර ගැනීමට/ තහවුරු කිරීමට පහත ක්‍රියාමාර්ග ගනු ලබන අතර, දැනට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය විසින් භාවිතා කරන සේවාවන් සඳහා ගෙවන ලද තැන්පතු සම්බන්ධයෙන් තහවුරු කිරීමේ ලිපි යොමු කර ඇත. ක්‍රියාත්මක වෙමින් පවතින අයිතම 18ක් අතරින් සම්පූර්ණ කරන ලද නිශ්චිත කාර්යයන් හෝ සිදුවීම් සඳහා අදාළ සියලුම ලේඛන සමඟ මුදල් ආපසු ලබාගැනීම සඳහා ඉල්ලීම් ලිපියක් යොමු කර ඇත. | තැන්පතුව කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,478,605,198 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,709,452,864 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.230,847,666 ක පිරිහීමක් නිරීක්ෂණය විය. වියදම රු. 1,487,919,565කින් වැඩිවීම මෙම පිරිහීම සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකාවේ ජාත්‍යාන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් දඹුල්ල ජාත්‍යාන්තර ක්‍රිකට් ක්‍රීඩාංගනයේ පිහිනුම් තටාක ඉදිකිරීම් ව්‍යාපෘතියක් සිදුකිරීමට ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනය තීරණය කර ඇත. 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලපරිච්ඡේදය සඳහා එකතුව රු. 58,304,528ක් වූ මුදලක් මේ සඳහා ගෙවා තිබුණි. ඉහත ව්‍යාපෘතිය ගිවිසුම්ගත දිනය වූ 2019 දෙසැම්බර් 18 වන දින සිට මාස 6 ක් ඇතුළත නිම කිරීමට නියමිත වුවද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටද මෙම ව්‍යාපෘතිය නිම කර නොතිබුණි. | අපගේ ව්‍යාපෘති ගිවිසුම් හා අදාළ රෙගුලාසි (ICTA, CIDA) අනුව නියමිත ක්‍රියාවලිය අනුගමනය කරමින් ව්‍යාපෘති නිම කිරීමට කටයුතු කරමින් පවතී. කොවිඩ් 19 වසංගත ව්‍යාප්ති තත්ත්වය හා හංවතුර වැනි මානව පාලනයෙන් හෝ ක්‍රියාකාරකම්වලින් බැහැර සිදුවීම් හේතුවෙන් ව්‍යාපෘතිය අනුමත කිරීමෙන් පසු දීර්ඝ කාලයක් ගතව ඇත.<br>ව්‍යාපෘති කළමනාකරු/ ව්‍යාපෘති උපදේශක විසින් සහතික කරනු ලබන කාර්යයන් මත අත්තිකාරම් අයකර ගැනීම පදනම් වේ. ගිවිසුම හා රෙගුලාසි අනුව ව්‍යාපෘති කළමනාකරු (ICTA/CIDA) විසින් කාලය දීර්ඝ කිරීම අනුමත කර ඇති බැවින් ව්‍යාපෘතිය නිම කිරීමේ ප්‍රමාදයක් ඇති නොවේ.<br>සංශෝධිත ව්‍යාපෘති සැලැස්මට අනුව අත්තිකාරම් ශේෂ අය කරනු ඇත. | ඉදිකිරීම් කටයුතු හැකි ඉක්මණින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිස්ත්‍රික් ක්‍රිකට් ක්‍රීඩක ක්‍රීඩිකාවන්ගේ ක්‍රිකට් ක්‍රීඩා යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අරමුණින් හෙට්ටාපොළ ක්‍රීඩාංගනයේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇති අතර 2018 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා වූ කාලය තුළ ව්‍යාපෘතිය සඳහා රු. 32,067,363ක් වැය කර තිබුණි. ඉහත ඉදිකිරිම් ව්‍යාපෘතිය 2018 සැප්තැම්බර් 30 දින වනවිට නිම කිරීමට නියමිතව තිබුණද, සමාලෝචිත වර්ෂය අවසන් වනවිටත් එය අවසන් කර නොතිබුණි. එබැවින් ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටු නොවී තිබුණි. | හෙට්ටිපොළ ක්‍රීඩාගනයේ වැඩ අවසන් කර ඇත. මේ වනවිට අදාළ ගිණුම්කරණ තොරතුරු ඇතුළත් කිරීම සඳහා කොන්ත්‍රාත්කරු/ ව්‍යාපෘති කළමනාකරු/ ව්‍යාපෘති උපදේශකගෙන් අවශ්‍ය උපයෝගී ලේඛන ලබාගැනීම සඳහා කටයුතු කරමින් පවතී. කොවිඩ් 19 ව්‍යාප්ති තත්ත්වය හේතුවෙන් කොන්ත්‍රාත්කරුගෙන් අවශ්‍ය ලේඛන ලැබීමට ප්‍රමාද වේ. | ඉදිකිරීම් කටයුතු හැකි ඉක්මණින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය. |